සැ. යු. - 2023.08.25 දින පළ වූ අංක 2347 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2023 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,348 - 2023 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2023.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 514 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 515 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 සැප්තැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## වැලිසර දිසා අධිකරණයේ දී ය

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ණය සහනදායක ආඥාපනතේ 43 සහ 44 වන වගන්ති ක්‍රියාත්මක කිරීමේ සහ එකී ආඥාපනත යටතේ නෛසයි තීන්දුව සහ නියත තීන්දුව ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම.

ශාමලිකා ලූඩ්ස් විජේවර්ධන *විවාහයට පෙර* චන්දිරම්,
අංක 556/12, මීගමුව පාර,
කපුවත්ත.

නඩු අංකය : 3451/විශේෂ
වැලිසර දිසා අධිකරණ රිට් අංක : 19/22.

........................*පෙත්සම්කාරිය.*

*එදිරිව*

මුහුප්පු ආරච්චිගේ ජූඩ් දිලිප් කුමාර මැතිව්,
අංක 21/1, ශාන්ත ජූඩ් මාවත,
රිලවුල්ල, කඳාන.

......................*වගඋත්තරකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2016ක් වූ ජූලි මස 22 වැනි දිනැති නෛසයි තීන්දු ප්‍රකාශය වර්ෂ 2018ක් වූ ජනවාරි මස 02 වැනි දින ගරු අධිකරණය විසින් නියත කරන ලද අතර ඒ අනුව මෙම නඩුවේ ගොනු කර ඇති පෙ3 දරන ලේඛනය අනුව ණය සහනදායක මණ්ඩලයේ බේරුම් පනතේ සඳහන් සමථ කොන්දේසි ප්‍රකාර ව වගඋත්තරකරු කටයුතු නොකිරීම නිසා එනම් වගඋත්තරකරු විසින් සම්පූර්ණ සහ අවසාන සමතයක් වශයෙන් රු. 1,500,000.00 ක මුදල සහ වර්ෂ 2011ක් වූ ජූලි මස 20 වැනි දින සිට වසරකට 15% බැගින් වන පොලියත් සමග ගෙවිය යුතු බව ද, එකී සම්පූර්ණ මුදල ගෙවීම වගඋත්තරකරු විසින් පැහැර හැර ඇති බැවින් එකී ණය සහනදායක මණ්ඩලයේ සමාදාන බේරුම් ප්‍රකාර ව එහි සමථ කොන්දේසිවල සඳහන් පරිදි රු. 1,500,000.00 ක මුදල සහ වර්ෂ 2011 ක් වූ ජූලි මස 20 වැනි දින සිට වසරකට 15% බැගින් වන පොලියත් සමග වගඋත්තරකරු විසින් පෙත්සම්කාරියට ගෙවිය යුතු බවට ණය සහන ආඥාපනතේ 43 සහ 44 වගන්ති ප්‍රකාරව අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

එකී මුදල සහ පොලිය අයකර ගැනීම සඳහා නියෝජ්‍ය පිස්කල් විසින් වර්ෂ 2023ක් වූ මැයි මස 04 වැනි දින තහනමට ගෙන ඇති පෙ3 දරන ලේඛනයේ සඳහන් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති දේපළ අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසිවලට යටත්ව,

වර්ෂ **2023ක් වූ සැප්තැම්බර් මස 27** වැනි දින **පෙ. ව. 10.30ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් එවලේ ම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුලත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කඳාන යන ගම පිහිටි කැටකැලගහවත්ත නැමැති ඉඩමට ඩබ්ලිව්. ඩී. නන්නදන සෙනෙවිරත්න බලයලත් මිනින්දෝරු තැන විසින් 2010.06.14 දින මැන සාදන ලද අංක 8176 දරන පිඹුරේ කැබලි අංක 03 දරන කොටසින් වර්ෂ 2019.05.29 දින එකී මිනින්දෝරු තැන විසින් ම බෙදා වෙන්කරන ලද 3 A දරන කොටසට මායිම් :

උතුරට : ඉසෙඩ්. එෆ්. ඊ. අලස් හිමිකම් කියන ඉඩම සහ කැබලි අංක 3බී ද,
නැගෙනහිරට : කැබලි අංක 3 බී සහ 2 (මීටර් 3.2 පළල පාර) ද,
දකුණට : කැබලි අංක 02 සහ 04 ද,
බස්නාහිරට : ඩී. ජයසිංහ හිමිකම් කියන ඉඩම ද,

මායිම් වූ පර්චස් දහහතරයි දශම දෙකයි හතරක් (පර්. 14.24) විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පලතුරු ආදී සෑම සියලුදේත් වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 765/08 හි ලියාපදිංචි වී ඇත.

අධිකරණයේ අණ පරිදි,

ඩබ්. ආර්. ඒ. ධම්මිකා බණ්ඩාර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2023 ක් වූ අගෝස්තු මස 21 වැනි දින දී ය,
දිසා අධිකරණය - වැලිසර.

09-42

---

# විවිධ දැන්වීම්

## බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය.

(තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන)

### නොතීසිය

(07 වන රීතිය)

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 1035 දරන ස්ථානයෙ හි පිහිටි සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PV 1422 දරන ''හුන්ඩායි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්'' නැමති සමාගම අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : HC/CIVIL/48/2023/CO.
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, කොළඹ 01 සහ බත්තරමුල්ල, කඩුවෙල පාර, අංක 213 දරන ස්ථානයෙ හි ''බත්තරමුල්ල ශාඛාව'' වශයෙන් හඳුන්වන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත.

........................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය (තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන) ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

විසින් 2023 ජූලි මස 10 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2023 නොවැම්බර් මස 07 වැනි දින එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍යවන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ්,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 180, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.

*සටහන.*- එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ එම අදහස, ඉහත නම සඳහන් නීතිඥ මොහොමඩ් කලීල් මොහොමඩ් ඉර්ෂාඩ් යන අය වෙත ලිඛිත ව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ නීති ආයතනයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍යවන අතර, එය 2023 නොවැම්බර් මස 06 වැනි දින පස්වරු 6.00ට පෙර ඉහත නම් සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

09-76

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ඉන්ජිනියර්ස් ගිල්ඩ් ඔෆ් ශ්‍රී ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

උදය ගම්මන්පිල වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ඉන්ජිනියර්ස් ගිල්ඩ් ඔෆ් ශ්‍රී ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) ශ්‍රී ලංකාවේ සියලුම පුහුණුවලත් හා සුදුසුකම්ලත් ඉංජිනේරුවන්ගෙන් සමන්විත ජාතික මණ්ඩලයක් පිහිටුවීම ;

(ආ) ජාතික ආර්ථිකය සහ තිරසාර සංවර්ධනය සඳහා සෑම තරාතිරමක ම සිටින සියලුම වෘත්තියවේදීන්ට මග පෙන්වීම සහ මෙහෙයවීම මගින් සිවිල් සමාජයේ අභිවෘද්ධිය සහ සුමට පාලනය සඳහා දායක වීම ; සහ

(ඇ) දිනෙන් දින වර්ධනයවන තාක්ෂණයට සමගාමී ව ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා ඉංජිනේරු තාක්ෂණ ශිල්පීන් හා ඒ හා සමාන කාණ්ඩ යොදා ගැනීම ;

යනාදිය වේ.

උදය ගම්මන්පිල,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

09-98

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2023 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **සැප්තැම්බර්** | 2023.09.01 | සිකුරාදා | 2023.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.08 | සිකුරාදා | 2023.08.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.15 | සිකුරාදා | 2023.09.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.22 | සිකුරාදා | 2023.09.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.27 | බදාදා | 2023.09.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2023.10.06 | සිකුරාදා | 2023.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.13 | සිකුරාදා | 2023.09.27 | බදාදා | දහවල් | 12.00 |
| | 2023.10.20 | සිකුරාදා | 2023.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2023.11.03 | සිකුරාදා | 2023.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.10 | සිකුරාදා | 2023.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.17 | සිකුරාදා | 2023.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.24 | සිකුරාදා | 2023.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.